**කරච්චි ප්‍රාදේශීය සභාව**
**කිලිනොච්චි දිස්ත්‍රික්කය**
----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ඔක්තෝබර් 25 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කරච්චි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය අනුව මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 23 දින ඉදිරිපත් කර තිබූ අතර වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ රීති/ චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තියට අනුව කාර්යසාධන වාර්තා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීම සහ කරුණ ඉදිරි වර්ෂයේදී පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ අමුණනු ලැබේ. |

#### (ආ) ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. | සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කරනු ලැබූ ගිණුම්කරණ මූලධර්ම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි. එසේ වුවත්, |

| | | |
|---|---|---|
| | | ගිණුම්කරණ ප්‍රතිපත්ති වැරදීමකින් හෙළිදරව් කර නොතිබුණි. |

**(ඇ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සන අපද්‍රව්‍ය හිඟ ගාස්තුවල එකතුව රු.226,300 ක් ලැබිය යුතු ලෙස හෙළිදරව් කර නොතිබීමෙන් ලැබිය යුතු ආදායම් ගිණුමේ ශේෂයත්, ආදායමත් සමාලෝචිත වර්ෂයේ අඩුවෙන් දක්වා තිබුණි. | හිඟ ආදායම් අවසන් ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. | සභාව විසින් මේ දක්වා සන අපද්‍රව්‍ය පිළිබඳ ගිණුම් තැබීම මුදල් පදනමින් සිදු කළ බැවින් මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ආදායම් ලෙස හෙළිදරව් කර නොතිබුණි. ඉදිරි කාලයේදී උපචිත පදනමින් ගිණුම්ගත කෙරේ. |
| (ii) | සුළු ණය හිමියන් ගිණුමේ පැවති කර්මාන්ත 11 ක ගෙවීම්වල එකතුව රු.10,153,179 ක් 2019 මාර්තු 31 දින වන විටත් අදාළ කර්මාන්ත සම්පූර්ණ කර ගෙවීම් සිදුකර නොතිබුණි. මේ නිසා වත්කම් හා වගකීම් වැඩියෙන් දක්වා තිබුණි. | කර්මාන්තයන් අදාළ වර්ෂය තුළම සඳහන් කාල පරාසය තුළදීම අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | ඇතැම් කර්මාන්ත සඳහා ගෙවීම් සිදු කිරීම සඳහා අක් මුදල් ලැබී නොතිබීම නිසා අවසන් ගෙවීම් සිදුකළ නොහැකි විය. ඇතැම් කර්මාන්ත සඳහා මැයි මාසයේදී ගෙවීම් කර තිබුණි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක් ඉක්ම වූ කල් ඉකුත්වූ රු.659,623 ක තැන්පතු 09 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කළ යුතුය. | ඉක්මනින් ඇප මුදල් ලබාදීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) | මුදල් රෙගුලාසි 139 | වියදම් අනුමත කිරීමේ නිලධාරීගේ අත්සන් නොමැතිව රු.1,279,098 ක් වටිනා ගෙවීම් 15 ක් සිදු කර තිබුණි. | මුදල් රෙගුලාසිවල රීති අනුව කටයුතු කළ යුතුය. | සියළුම ගෙවීම් පූර්ව අනුමැතිය ලබාගෙන සිදු කර තිබුණි. එසේ වුවත්, වැරදීමකින් අනුමත කිරීමේ නිලධාරීගේ අත්සන් ලබා ගෙන නොතිබුණි. දැන් අත්සන් කර නිවැරදි කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XXIV පරිශිෂ්ඨය 4 වගන්තිය | සේවය හැරගිය, සේවය අත්හිට වූ සහ විශ්‍රාම ගිය නිලධාරින් 09 දෙනෙකුගෙන් අයවියයුතු රු.330,304 ක හිඟ ණය මුදල් පසුගිය වර්ෂ 01 සිට වර්ෂ 08 දක්වා අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාළ කාලය තුළ ණය අයකිරීමට ක්‍රියා කළ යුතුය. | නිලධාරීන්ගෙන් හිඟ ණය රු.330,304 න් රු.134,419 ක් අයකර ගෙන ඇත. ඉතිරිය අයකිරීමට කටයුතු සලසා ඇත. |
| (ඇ) | පළාත් මූල්‍ය රෙගුලාසිවල අංක 163(3) රීතිය | රු.3,714,176 ක අත්තිකාරම් 04 ක් අදාළ වන පරිදි අදාළ කාලය තුළ නිරවුල් කර නොතිබුණි. | අත්තිකාරම් අදාළ කාලය තුළ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | සිවනගර්, උරුත්තිරපුරම් මාර්ගය ප්‍රතිසංස්කරණ අත්තිකාරම් රු.2,500,000 ක් 2019 ජනවාරි 22 දින නිරවුල් කර ඇත. අනෙකුත් අත්තිකාරම් 03 සඳහා වූ අරමුදල් නොලැබීම නිසා නිරවුල් කර නොතිබුණි. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උදයනගර් නිවාස 30 ක් සැලසුම් කිරීමේ මාර්ග ප්‍රතිසංස්කරණ ගෙවීම්වලදී එකතු කළ අගය මත බදු පනත අනුව කොන්ත්‍රාත්කරු බදු ලියාපදිංචියේ අක්‍රීය කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් පැවති නමුත් රු.411,568 ක එකතු කළ අගය මත බදු සඳහා ගෙවීම් කර තිබුණි. | එකතු කළ අගය මත බදු පනත අනුව ක්‍රියා කළ යුතුය. | පිළිතුරු ලබා දී නැත. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු. 77,734,689 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 85,704,856 ක් විය.

**2.2** මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 පෙබරවාරි 28 දිනැති වවුචර් අංක 109 මඟින් රු.367,260 ක් ලී බඩු මිලදී ගැනීම සඳහා ලබා දී තිබූ අත්තිකාරම් සහ 2018 මාර්තු 21 දිනැති වවුචර් අංක 151 මඟින් ලී බඩු මිලදී ගැනීම සඳහා ලබා දුන් රු.76,995 ක අත්තිකාරම් පිළිවෙලින් මාස 10, 11 කාල ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. | පළාත් මූල්‍ය රීති 163 (ii) ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. | ලී බඩු අත්තිකාරම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී නොතිබූ නිසා සභාවේ අරමුදලින් දෙසැම්බර් මාසයේ දී ගලපා තිබුණි. |

**2.3** ආදායම් පරිපාලනය

**2.3.1** ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,000,000 | - | - | - | 200,000 | - | - | - |
| (ii) | කුලී | 31,960,000 | - | 38,669,757 | 5,932,692 | 32,180,000 | - | 39,038,907 | 5,731,702 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 5,362,000 | - | 7,230,545 | - | 5,406,000 | - | 6,646,677 | - |
| (iv) | වෙනත් ආදායම් | 28,482,600 | - | 58,770,789 | 42,193,973 | 24,032,870 | - | 63,050,128 | 33,445,040 |
| | | **66,804,600** | **-** | **104,671,091** | **48,126,665** | **61,818,870** | **-** | **108,735,712** | **39,176,742** |

**2.3.2** ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ප්‍රසම්පාදන කමිටු තීරණ මින් |

| | | | |
|---|---|---|---|
| | නැවත මිල කැඳවීම්, බදු දීම් සියල්ල ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව කටයුතු නොකර බදු ගිවිසුම් අත්සන් නොකර ලබා දීමේ ක්‍රියාවලිය අනුගමනය කර තිබුණි. මේ නිසා නැවත මිල කැඳවීමේ දැන්වීමත්, කිසිදු කමිටු තීරණයක් රහිතවම සිදු කර තිබුණි. | අනුව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී ලිඛිතව සිදු කරනු ලැබේ. වැරදීමකින් බදු ගිවිසුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | කිලිනොච්චි හරක් මස් කඩය සඳහා 1, 2 මිල කැඳවීම්වලදී ලිඛිතව මිල ගණන් ඉදිරිපත් කර තිබූ පුද්ගලයෙකුගෙන් එම මිල ගණන්වලට බදු සඳහා ලබානොදී තෙවැනි ප්‍රසිද්ධ වෙන්දේසියේ අදාළ පුද්ගලයාට රු.2,145,000 කට බදු දී තිබූ නිසා සභාවට රු.555,500 ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව කටයුතු කළ යුතුය. | අදාළ පුද්ගලයා තැන්පතු මුදල් ගෙවීම පැහැර හැරීම නිසා බදු දි නොතිබුණි. |
| (ඇ) | මෝටර් ග්‍රේඩරය සහ රෝලරය භාවිතා කර ක්‍රියාත්මක කළ කාර්යයන්වල හිඟ ආදායම්වල එකතුව රු.1,070,625 ක් පසුගිය වර්ෂ 1 සිට 2 කට අධික කාලයක සිට අයකිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකිරිමට කටයුතු කළ යුතුය. | කොටස් වශයෙන් අයකිරීම් සිදුකරමින් පවතී. ඉතිරිය අයකිරීමට කටයුතු කෙරෙමින් පවතී. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ඝන අපද්‍රව්‍ය ගාස්තු රු.226,300 ක් ව්‍යාපාරික ස්ථාන 22 කින් අයකර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකිරිමට කටයුතු කළ යුතුය. | කොටස් වශයෙන් අයකිරීම් අයකරගෙන ඇත. ඉතිරිය අයකිරීමට කටයුතු කෙරෙමින් පවතී. |
| (ඉ) | 2018 වර්ෂ අවසානයේ පැවති රු.5,932,692 ක කුලී හා බදු මුදල් වර්ෂ 01 සිට වර්ෂ 07 ක කාලයක් අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකිරිමට කටයුතු කළ යුතුය. | හිඟ මුදල්වලින් අයකර ගත හැකි හිඟයන් අයකරමින් පවතී. අනෙකුත් ඒවා නීතිමය ක්‍රියාමාර්ග සඳහා යොමු කර ඇත. |
| (ඊ) | සභාව තම ආදායම් ලැයිස්තු ගත කර එක්රැස් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග පසුගිය වර්ෂ 10 ක් තිස්සේ ගෙන නොතිබුණි. | ආදායම් ලැයිස්තු ගත කර රැස්කිරීමට කටයුතු කළ යුතුය. | ආදායම් අයකිරීම ගැසට් පත්‍රයේ පලකර එකතු කරමින් පවතී. |

**2.3.3 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1989 ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලන රීති පරිච්ඡේදයේ III පරිච්ඡේදයේ 32 වගන්තිය අනුව සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු ආදායම් වශයෙන් රු.1,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. එසේ වුවත්, ඇස්තමේන්තු ප්‍රකාරව වරිපනම් හා බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ රීතීන්වල අනාවරණය කිරීම් අනුව අයකිරීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

**2.3.4 කුලී**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වෙළඳ බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මාස 02 ක් අඛණ්ඩව කුලී ගෙවීම පැහැර හරිනු ලබන විටකදී ව්‍යාපාරික ස්ථානයේ වගකීම සභාව විසින් භාරගනු ලබන බවට සඳහන් කොන්දේසිය අනුව කටයුතු නොකිරීම නිසා ව්‍යාපාරික ස්ථාන 78 කින් රු.1,739,264 ක කුලී ගාස්තු අයකර ගැනීම සිදු කර නොතිබුණි. | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින අතර, ඉදිරියේදී ව්‍යාපාරික ස්ථාන සභාවේ භාරයට ගනු ලැබේ. |

**2.3.5 බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1980 වර්ෂයේ අංක 47 දරන ජාතික පරිසර පනත 23(අ) සහ අංක 1533/16 දරන 2008 ජනවාරි 25 දිනැති රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් අනුව පරිසර බලපත්‍ර ලබා නොගෙන සහ බලපත්‍ර අලුත් නොකර පැවැති ඇඹරුම්හල් 06කින් රු.42,000ක් අයකර ගෙන නොතිබුණි. | නියමිත චක්‍රලේඛ උපදෙස්වලට අනුව ක්‍රියාකළ යුතුය. | මෙම වර්ෂයේදී මේවා නිරවුල් කිරීමට කටයුතු කෙරේ. |

**2.3.6 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.30,811,527 ක උසාවි දඩ මුදල් සහ රු.10,154,071 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ලැබිය යුතු උසාවි දඩ මුදලින් රු.27,113,894 ක් 2019 ජනවාරි සහ මාර්තු මාසවල දී ලැබී තිබුණි. මුද්දර ගාස්තු රු.8,049,591 ක් 2019 මැයි මාසයේදී ලැබී තිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ සහ පොදු පොදු උපයෝගිතා සේවා ,වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය 3 පහසුව හා ,ජනතාවගේ සුබ විහරණය ,මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීමපිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ රීතින් අනුව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් පිළිබඳව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීම පිළිබඳව නිලධාරීන්ට පුහුණුවක් ලබාදීමට තීරණය කරන ලදී. පුහුණුවෙන් පසුව පිළියෙල කිරීම පහසු වේ. |

**(ආ) මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ප්‍රමාදවීම්**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උදය නගර නිවාස 30 ක් ඉදිකිරීම් මාර්ග අලුත්වැඩියා කටයුතු නියමිත කාල පරාසය තුළ නිමකර නොතිබූ බැවින් කොන්ත්‍රාත් ගිවිසුම් ඇමුණුම් 6.4 අනුව කාල ප්‍රමාදය සඳහා දඩ ගාස්තු රු.193,751 ක් අයකර ගෙන නොතිබුණි. | ප්‍රමාද ගාස්තු අයකිරීමට ක්‍රියාකළ යුතුය. | උදය නගර නිවාස 30 ක් ඉදිකිරීම් මාර්ග අලුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් කාලය ප්‍රමාද වීමේ ගාස්තු අයකර නොගැනීම සඳහා පැහැදිලි හේතු හඳුනාගෙන ඔබ විසින් සඳහන් කර ඇති අවස්ථාව ප්‍රකාරව ඇප මුදලින් අයකර ගැනීමට කටයුතු කෙරේ. |

(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අප්‍රේල් 23 දිනැති අංක ක.සෙ.පොදු/2018/61 දරන චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කරගැනීමට සභාව විසින් යෝග්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. | චක්‍රලේඛය අනුව සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඇත. මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමේ පුහුණුවක් ලබා දී ඉදිරි වර්ෂවලදී ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර ඇත. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 119 ක් හා තථ්‍ය සේවක සංඛ්‍යාව 97 ක් වශයෙන් පැවති අතර පුරප්පාඩු 25 ක් සඳහා බඳවා ගැනීම් සිදුකර නොමැති අතර සේවකයන් 03 දෙනෙකු සඳහා විධිමත් අනුමැතිය ලබා නොගෙන අතිරික්ත වශයෙන් අනුයුක්ත කර තිබුණි. | සේවක පුරප්පාඩු පිරවීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | සේවකයන් දෙදෙනෙකු ස්ථාන මාරුවීම් ලබා ගොස් ඇත. සේවක පුරප්පාඩු 04 ක් පුරවා ඇත. 05 දෙනෙකුගෙන් යුතු සේවක සංඛ්‍යාවක් වෙනමම සිටිති. ඉතිරි සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇත. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | අරිවියල් නගර් ආදාහනාගාරයක ඉදිකිරීම් කටයුතු 2017 වර්ෂයේ ක්‍රියාත්මක කර තිබුණි. ප්‍රමාණ පත්‍ර බිල්පත් 2017 නොවැම්බර් 22 දින පිළියෙල කර රු.495,138 ක් ගෙවීම් කර තිබුණි. එසේ වුවත්, කර්මාන්තය 2019 ජනවාරි මාසයේදී ක්‍රියාත්මක කර තිබුණි. | - | පිළිතුරු ලබා දී නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කළ කාර්යය තක්සේරු කිරීමේදී ඉටු කර තිබූ කාර්යය අඩු බැවින් රු.162,681 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි. | තක්සේරු කිරීම්වලට අනුව ගෙවීම් කළ යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට පැවැති ස්ථාවර වත්කම්වල වටිනාකම එකතුව රු.243,685,587ලෙස දක්වා තිබුණි. එසේ වුවත්, සභාව විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. | ස්ථාවර වත්කම් හඳුනාගෙන වර්ගීකරණයට ලක්කර ලේඛනගත කිරීමට මෙම වර්ෂයේ සිට ක්‍රියාකරනු ලැබේ. |

**3.4.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීම**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිනි නිවීමේ රථයට ආදායම් බලපත්‍ර සහ රක්ෂණාවරණය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂික ආදායම් බලපත්‍රය සහ රක්ෂණාවරණය ලබාගැනීමට කටයුතු කළ යුතුය. | ගිනි නිවීමේ රථය රජයේ බලධාරියා විසින් ප්‍රාදේශීය සභාවට පරිත්‍යාග කළ එකකි. මෙහි රක්ෂණය සහ ආදායම් බලපත්‍රය ලබාදිය නොහැකි නිසා 2020 වර්ෂයට අදාළ අයවැයෙන් ප්‍රතිපාදන වෙන්කර ලබාගැනීමට කටයුතු කර ඇත. |

**3.4.3 නඩත්තුව හා අලුත්වැඩියා කිරීමට අපොහොසත් වීම**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ වාහන 11 ක් භාවිතා කළ නොහැකි තත්ත්වයේ පැවතුණි. මේවා භාවිතා කළ හැකි පරිදි අලුත්වැඩියා කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | භාවිතා කළ නොහැකි තත්ත්වයේ පවතින වාහන අලුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. | වැඩිපුර වාහන පවතින නිසා ඉදිරි වර්ෂවලදී කරච්චි නගර සභාව, කරච්චි ප්‍රා දේශීය සභාව සහ කන්දාවලෙයි ප්‍රාදේශීය සභාව වශයෙන් වෙන්කිරීමේදී මෙම වාහන අලුත්වැඩියා කර වෙන්කර බෙදාදීමට තීරණය කර ඇත. |

### 3.4.4 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ප්‍රයෝජනය සඳහා සභාවට පරිත්‍යාග කර තිබූ වාහන මේ දක්වා සභාවේ නමට පවරාගෙන නොතිබුණි. | වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | ඇතැම් වාහන පවරාගෙන ඇත. අනෙකුත් වාහන පවරා ගැනීමට කටයුතු කර ඇත. |

### 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වට්ටක්කච්චි ආයුර්වේද වෛද්‍ය ශාලාවට 2018 වර්ෂයේදී රු. 700,000කට ජල ටැංකියක් ඉදිකර තිබුණි. එසේ වුවත්, ටැංකියට ජලය පිරවීමට නොහැකි නිසා නිෂ්කාර්යව පැවැතිණි. | නිෂ්කාර්යව පවතින වත්කම් භාවිතා කිරීමට ක්‍රියා මාර්ග ගත යුතුයි. | ජලය පිරවීමට දෙවරකි නළ ළිං ඉදිකරන ලදි. නමුත් ජලය මහජන භාවිතය සඳහා සෞඛ්‍යාරක්ෂිත නොවූ බැවින් කෘෂිකර්ම දෙපාර්තමෙන්තුවෙන් ජලය පිරවීමට සැලසුම් කර ඇත. |
| (ii) | අම්බාල්කුලම් ප්‍රදේශයේ පිහිටි ඉඩමට රු. 1,760,000ක පිරිවැයට 2017 වර්ෂයේදි තාප්ප ඉදිකර තිබූ නමුත් ඉඩමේ කැලෑ වැවී නිෂ්කාර්යව පැවැතිණි. | නිෂ්කාර්යව පවතින වත්කම් භාවිතා කිරීමට ක්‍රියා මාර්ග ගත යුතුයි. | ඉඩමේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වී ඉඩම වටා තාප්පය ඉදිකර ඇත. |

### 3.6 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාවේ උප කාර්යාලය අලුත්වැඩියා කිරීමේදී ටයිල් ඇල්ලීම සම්බන්ධයෙන් රු.493,328 ක් වැයකර තිබුණි. මෙම කාර්යය අවසන් වීමේදී රු.52,172 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩියෙන් ගෙවන ලද මුදල් අයකර ගැනීමට ක්‍රියාකළ යුතුය. | 2017 වර්ෂයේ පැවති ගංවතුර ආපදා තත්ත්වයේදී කාර්යාලයට ජලය ගලා ඒම හා පොළොවෙන් ජලය මතුවීම හේතුවෙන් සිමෙන්තියේ ශක්තිය හීන වීම නිසා ඇතැම් ටයිල් කැට මතු වී තිබුණි. ඉන් පසුව, කරදරකාරීව පැවති නිසා ඉතිරි ටයිල් ද ඉවත් කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| (ii) | වට්ටක්කච්චි ආයුර්වේද වෛද්‍ය ශාලා ගොඩනැගිල්ල ඉදිකිරීමේ සැලැස්මේ සත්‍ය පරිමාණයන් තක්සේරු පත්‍ර යේ මිනුම් හා වෙනස් වන බැවින් රු.718,395 ක් වැඩියෙන් කොන්ත්‍රාත්කරුට ගෙවීම් සිදු කර තිබුණි. | වැඩියෙන් ගෙවන ලද මුදල් අයකර ගැනීමට ක්‍රියාකළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |